රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2007 (I)

මගේ අංකය :පිඑච්/එච්/ජී/බී/පොදු 03
නිවාස හා විශ්‍රාම වැටුප් අංශය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
කොළඹ-07.

**2009.03.05**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

**නිවාස පහසුකම් ලබාදී නොමැති ගරු අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය**
**<u>අමාත්‍යවරුන්ට කුළී පදනම මත නිවාස ලබා දීම.</u>**

උක්ත ශීර්ෂයෙන් යුක්තව නිකුත් කරන ලද 10/2007 චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

ලෝක ආර්ථික පසුබෑම හමුවේ වුවද උතුරු නැගෙනහිර ප්‍රදේශ ඇතුළු ජාතික හා පළාත් මට්ටමේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දීම පිණිස අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා රජයේ වියදම් අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව දැනට නිවාස පහසුකම් ලබාදී නොමැති නමුත් නිවාස පහසුකම් ලබා ගැනිමට හිමිකමක් ඇති ගරු කැබිනට් අමාත්‍යවරුන්ට, කැබිනට් නොවන අමාත්‍යවරුන්ට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ට, කුලි පදනම මත නිවාස ලබා ගැනිම සඳහා ඒ ඒ අමාත්‍යාංශ සතු ප්‍රතිපාදන සීමාව යටතේ මාසිකව ලබා දුන් රුපියල් ලක්ෂයක දීමනාව, රුපියල් පනස් දහස දක්වා අඩු කෙරේ.

එනමුත් ඉහත චක්‍රලේඛයේ සඳහන් අනිකුත් නියමයන් එපරිද්දෙන්ම බල පැවැත්වේ.

**2009.01.07** දින අමාත්‍ය මණ්ඩලය විසින් ලෝක ආර්ථික පසුබෑම හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීම පිළිබඳව ගත් තීරණ අනුව මෙම චක්‍රලේඛය නිකුත් කරන අතර, ඒ අනුව **2009.01.07** දින සිට මෙම විධිවිධාන ක්‍රියාත්මක කෙරේ.

**ඩී.දිසානායක**
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,